# අත්තම්මගෙ දත වැටිලා



ආදර්ශ්නා ගජේන්ද්‍රා

# අත්තම්මගෙ දත වැටිලා

ආදර්ශ්නා ගජේන්ද්‍රා

කතෘගේ වෙනත් කෘති

1.ගුරුතුමීට තෑග්ගක් ISBN 978-624-206-592-2(15.11.2023)

2.කවි මුතු වැල් ISBN 978-624-206-593-9(15.11.2023)

3.The Little seed's big adventure ISBN 978-624-206-715-5(15.11.2023)

4. Caterpillar's Magical journey ISBN 978-624-206-716-2(15.11.2023)

5. The Little Raindrop ISBN 978-624-206-717-9(15.11.2023)

6.Everyone is Special ISBN978-624-206-718-6(15.11.2023)

කතෘගෙන් වචනයක්..

මට මෙම "අත්තම්මාගෙ දත වැටිලා" පොත වගේම තවත් පොත් 6ක් ලියන්නට
"දිවිය දිනන විද්‍යුත් පොතක්" වැඩසටහන උදව්වුණා. ඒ සඳහා මට අවස්ථාව
ලබාදුන් ආදරණීය විදුහල්පතිනිය ශශිකලා සේනාධීර මහත්මියට සහ ප්‍රාථමික
අංශ භාර විදුහල්පතිනිය අල්විස් මහත්මියට ස්තුතියි!ඒ වගේම මං වගේ පුංචි
ගත්කතුවරියන්ට නිතර උපදෙස් ලබාදෙන සෙනෙවිරතර ගුරු පියාට සහ නිතරම
පසුපස සිටිමින් අපව දැනුවත් කරන සමන්මලී ගුරුමෑණියන්ටත් ස්තුතියි!
මගේ ආදරණීය පන්තිභාර ගුරුතුමිය නෙරන්ජලා වීරසිංහ ගුරුමෑණියනි,මා
නිතර පොත් ලියන්නට උනන්දු කර, වැරදි නිවැරදි කර දුන් ඔබට පින්.ඔබ
උනන්දුකරවූ නිසාම මට පොත් රාශියක් ලියන්නට පුලුවන්වුණා. ඒ වගේම
ඉංග්‍රීසි ගුරුතුමිය ලක්ෂිකා මහත්මියට ද මා නිවැරදි කළාට ස්තුතියි!
මගේ පළමු ගුරුතුමිය වන රංජනී සෙන්දනායක ගුරුතුමියණි, මට මුලින්ම
අකුරු ඉගැන්වූයේ ඔබයි. ඔබ කියාදුන් අකුරු වලින් මම පොත් ගොඩක් ලිව්වා.
1 වසරේ දී ලියූ "බෝංචි ඇටේ ගසක් වෙලා "පොත එළිදැක්වීමට ලැබීම මට
සතුටක්. චම්පා මාපාරත්න ගුරුතුමියනි, ඔබ මා ගැන නොදත්තක් නැත. ඔබ
මට දුන් ගුරුහරුකම්වලට පිදූ උපහාරයයි මගේ "ගුරුතුමීට තෑග්ගක්"
පොත.ඔබ වෙනුවෙන් ලියූ පොතද මම එළිදක්වමි.
මගේ සෙවනැල්ල වගේ පසුපසින් හිඳ සියලු දේට උනන්දුකර, සියලු
දේ ලබාදෙන මගේ ආදරණීය අම්මාටත්, අප්පච්චිටත්, පවුලේ සියලු
දෙනාටමත් මගේ ස්තුතිය පිරිනමමි.මේ පොත් සියල්ලම ඔබ සියලු
දෙනාටම හදවතින්ම පුදමි..
ඔබේ ආශිර්වාදය මා තවත් දිරිමත් කරනු ඇත.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදයි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන අවශ්‍යතාවයක් සපුරාලීමකි.


එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදයක් මෙන්ම ගත් කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ" දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන්, ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



අත්තම්මගෙ කටේ තිබුණු
ඉස්සරහම දත වැටිලා
ලේන් කටක් වගෙයි කියා
ඒක දැකපු අපට හිනා

ඉතින් බැරිද අපට වාගෙ
ඉල්ලගන්න දතක් ආයෙ
වැටිච්ච දත ලේනට දෙමු
අලුත් දතක් ඉල්ලාගමු

මල්ලි එහෙම අහපුවාම
අත්තම්මට හරිම හිනා
නාකි අපට දත් දෙන්නට
ලේනට දත් නැතිලු කියා

ඉතින් මොකද දැන් කරන්නෙ
අපෙ අත්තම්මා දුකින්නෙ
කොහොමින්හරි සොයා දෙන්න
ඕනෑ සුදු දතක් ආයෙ




මල්ලි එක්ක එකතුවෙලා
ඇන්දා බොරු දත කොළයක
නිදාහිටිය අත්තම්මගෙ
කටේ ඇලෙව්වා බොරු දත

ඉවසගන්න බැරි තරමට
හිනා ගියා අපි හැමටම
බොරු තරහක් අරන් එයා
එලව ගත්ත අපි දෙන්නට



හයිය දෙයක් හපන්න බෑ
හිනා වෙන්න දැන් මට බෑ
කතා කරන දේ හරියට
පැහැදිලි නෑ කියයි එයා

කතා කරන විට ඇය දැන්
හුළං යනව වගේ කටින්
පොහ් පොහ් ගා කතා කළොත්
හිනා යන්නෙ අපට ඉතින්



වයසටනේ දත් වැටෙන්නෙ
මොකටද ඔය දුකෙන් ඉන්නෙ
බොරු දත් මොකටද දමන්නෙ
තව ටික දවසයිනෙ ඉන්නෙ

අත්ත එහෙම කියපු ගමන්
තරහ ගියා හුඟක් ඇයට
අලුත් දතක් හදා ගන්න
අත්තම්මා කරයි දබර



දත් දොස්තර ළඟට ගිහින්
අලුත් දතක් හදාගන්න
අපෙ අම්මා එක්ක ඔන්න
අත්තම්මා ගියා නුවර

තව සතියක් විතර ගියා
අත්තම්මට දතක් එන්න
මඟ බල බල හිටියෙ එයා
අලුතින් දත දමා ගන්න




කොහොමින්හරි අලුත් දතක්
අරගත්තා අත්තම්මට
ඒක අරන් දුන්න දවසෙ
ආවේ ආඩම්බරේට

ඒක දාපු මුල්ම දවසෙ
මඟුල් ගෙයක් වගෙයි ගෙදර
ඇගෙ හිතවත් සැමදෙනාට
හිනාවෙලා පෙන්නයි දත



දැන්නම් නැහැ තරහ යන්නෙ
හිනා වෙලා නිතර ඉන්නෙ
පොඩි අපි වගෙමයි නොවේද
නිතර හිතුණ අපි දෙන්නට

නැලු හිනා වෙන්න රෑට
නින්දට පෙර ගලවයි දත
තියලා පෙට්ටියක් ඇතුලෙ
ආයෙත් දාගයි උදේට



දැන් ටික ටික කල් යනකොට
අඩුවෙනවා වටිනාකම
දවසක්දා දැක්කා මම
ලෙවකනවා පූසි ඒක

අමතකවීලා තිබු තැන
පෙරල පෙරලා හොයයි ගෙදර
මල්ලීගෙත් මගෙත් නිතර
උදවු ඕනැ එවිට ඇට



එහෙම වෙච්ච වෙලාවකට
අත්තාටයි බැණුම් වැස්ස
අම්මාටත් ටිකක් එතන
බූලාටත් ගුටි දෙක තුන

දත් තිබුණත් නැතත් කටේ
අම්මාමයි ඔබත් අපේ
ආදරයෙන් අපිව රකින
වඳිමු මල්ලි අත්තම්මට



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශ්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතු වරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතිය නිර්මාතෘ
2023.10.20



**ආදර්ශිනා ගජේන්ද්‍රා**

978-624-208-095-6